# කවි ගී

# උයන

L.P. සනුති ගිහංගා

# කවි ගී දැහැන

L . P සනුනි ගිහංගා
කතෘ

මාගේ අනෙකුත් කෘති
(i) මාගේ අපූරු උපන්දින තෑග්ග.
(ii) සීයාගේ අරුම පුදුම ගෙවත්ත

පාසල - මහ / මහමායා බාලිකා විද්‍යාලය
ශ්‍රේණිය - 8 ශ්‍රේණිය
පලකල දිනය - 2026 . 05 . 10
ISBN - 978 624 211 158 2

# පිදුම

මාගේ දයාබර ගුරු මෑණියන්ටද

ආදරණීය දෙමව්පියන්ට ද

යහළු යෙහෙළියන්ටද

මෙම කෘතිය ආදරයෙන් ගෞරවයෙන්

යුතුව පිළිගන්වමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

අම්මා

දස මසක් හොවා
මා ලොව බිහි කරලා
ලේ කිරි කර දී මා හට
ජීවය දීලා.......

අපමණ දුක් පීඩා මැද මා
උස් මහත් කර.....
ඔබමයි රැජින මා ලොව
පෙරටම සිටින......

හොද මෙන් නරකද මනා ලෙස
මා හට කියලා.....
ඔවදන් දෙමින් ඇති දැඩි කරලා...
අම්මා ඔබයි මාගේ ජීවය
සැමදා.



තාත්තා

පියාණෙනි ඔබ මට සැමදා
වීරයකි ලොවටම මා දන්නා..
අප ජීවත් කරවන්න
දහඩිය පොළොවට තියලා
රහසේම දුක් වින්දා
ඔබ නිතරම සැමදා..

අභියෝග ජය ගන්නට
මා පුරුදු කරලා..
මා පසු පස ඔබ එයි
නිතරම සැමදා..
තාත්තේ ඔබයි නිවන් දක්නට
මාගේ පැතුමක් ලෙසයි ජය සිතෙහි.



## පාසැල මගේ


මහමායා දෙරණට මා පය තැබූ
මොහොතේ
පළමුව දැනුනු අභිමානය මා හට
සිතෙහි
අකුරු කරන්නට ලැබුණු පිනකි
ඒ පොළොවේ.

මහමායාවකි සැම විට මාගේ
සිතෙහි...
වෙර දරමි ගුණවත් නැණවත් වන්නට
නිසි සේ
අභිමන් දියණියක් වන්නට
රිසි සේම
මහාමායා බාලිකාව මාගේ පාසැලයි
දිවිතුරා සිතෙහි මගේ



# වැස්ස

කළු කර වූ අහස ඔරවමින්
පොළොවට
කොළ වැටෙමින් සිසිකඩ
පොළොවට
කිචි බිචි ගා කුරුළු රංචු
පියඹමින්
පරිසරයම කඳුලක් සේ
වැළපෙමින්
සුළං හමා දසත ගොසින්
හෝ ගාමින් වැහි බිංදු වැටෙයි
සීතල වූ යාමයකි
වැස්ස නුඹයි
ඒ



## මුහුද

හෝ හෝ ගාමින් මහ හඬ
නගමින්
නිල වර්ණයෙන් හැඩයට
එමින්
දුටුවන් පිනවන ලස්සන ඔබයි
රැල්ල නගයි ඒ සයුර ඔබයි




ගුරු මෑණිවරුනි

අකුරු කරන්නට එන්නෙමි
පිය නගමින් ඔබ වෙත
කරුණා ගුණයෙන් යුතු
මෑණියකි ඔබ සතු
අනාගතේ ගැන කියමින්
ඔබ තතු
වරදින් මුදවා ගන්නෙ
නිරතුරු
මවට පසුව මවකි ඔබ සැමදා
ආදරයයි සෙනෙහසයි බෙදමින් සැමදා
ලෙන්ගතු ආලය ඔබගේ සැමදා
ඒ ඔබ කවුරුත් නොව සැමදා
ගුරු මෑණියනි ඔබමයි ඒ සැමදා



# උදෑසන

හිරු කිරණින් ලොව මවිත වේ
කිචි බිචි ගා සියොතුන්
ඉගිලෙයි
ගස් වල කොළ අතු මල් ඇහැරෙයි
කුක්කු කූ කියා හඬ ද ඇසෙයි
මන් මත් වූ ඒ යාමයයි
කඩිසර වී මුළු ලොව ඇහැරෙයි
උදෑසනකි ඒ ලොව පිබිදෙයි



## සීයා


මා පොඩි කල සිට
මා පසු පස සිට
සියලුම දග වැඩ බලමින්
සැම විට . . . .
ආදරයයි කරුණාවයි නිසි ලෙස
දුන්නෙ ඔබමයිසීයේ මට ඔබ
පියාණන්ට පසු ඔබද පියෙකි මට
සයුරක් සේ ආදරයක් කැටි කර
නිතරම කැප වී මා වෙනුවෙන් ඔබ
සීයා මාගේ පණ රැක සැම විට . . .



ගම

මනරම් මහවැලි නදියෙන් ගලනා
දළදා මාළිගේ අභියස සිටිනා
කඳු වැටි අතරින් මැදිවට තියෙනා
ලේවැල්ලෙ නම මගේ ගම සැමදා..

සුන්දර මිනිසුන් සැමදා සිටිනා
ආඩම්බරයකි එය මට කීමට සැමදා..
ගංගාරාමය පින් බිම තිබෙනා
අරුමෙකි මගේ ගම ලේවැල්ලයි
සැමදා..



නංගී

පුළුන් බෝලයක් වැනි මගේ නංගී
සුරතල් දඟ වැඩ කරනා නංගී
බෝනික්කෙකු සේ සෙල්ලම් කරනා
මගේම ලස්සන නංගී

රණ්ඩු වෙවී තරහා වෙවී ඉන්නේ
මා සමගින්
දවස ගෙවෙන්නේ ඇයගේ සිනා
සමගින්
ඇය නොමැතිව මා හට පාළුයිනේ
නංගී මගේ පණමෙන් සැමදා



# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN - 978 624 211 158 2